

# බොක්සිං ශූරියට රන් පදක්කමක්

ශ්‍රීලංකා කාන්තා බොක්සිං ඉතිහාසයේ නව පිටුවක් පෙරළමින් නිල්මිණී ජයසිංහ රුසියාවේ පැවති අන්තර් ජාතික බොක්සිං තරඟාවලියේදී රන්පදක්කම දිනාගත්තාය. කි ග්‍රෑ 51 බර පන්තියෙන් තරඟ වැදුණු නිල්මිණී කැනේඩියානු ක්‍රීඩිකා මැන්ඩි ජුඩෝල් පරදවා ලැබූ රන්පදක්කම මෙතෙක් ශ්‍රීලාංකා කාන්තා බොක්සිං ඉතිහාසයේ ලෝක මට්ටමේ ප්‍රථම රන් පදක්කම හා අපට ලැබුණු උසස්ම මට්ටමේ ජයග්‍රහණය ද බව කිව යුතුය. 29 හැවිරිදි නිල්මිණී සහ 31 වියැති අනුෂා කොඩිතුවක්කු පමණක් අපේ රට සඳහා සහභාගි වූ මෙම තරඟාවලිය පසුගිය දා රුසියාවේ සන්ට් පීටර්ස්බර්ග් නුවරදී නිමාවට පත්වූයේ අපේ සහභාගිවූ ක්‍රීඩිකාවන් දෙදෙනාම පදක්කම් දෙකක් ලබමින් රටට ගෞරවයක් අත්කර දෙමිනි. නිල්මිණී රන්පදක්කමක් ලැබූ අතර අනුෂා කිග්‍රෑ 46 ක් බර පන්තියේ ලෝකඩ පදක්කමක් හිමිකරගත්තා ය.



*නිල්මිණි ජයසිංහ (දකුණේ) ප්‍රහාරයක් එල්ල කරමින්*

පන්නල ස්ලිම් ලයින් ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් කාන්තා බොක්සිං ක්‍රීඩාවට අවතීර්ණ වූ මේ ක්‍රීඩිකාවෝ පසුගිය වසර 6 පුරාම දක්‍ෂතා පෙන්වූහ. 2006 වසර වියට්නාමයේ පැවති ආසියානු බොක්සිං ශූරතාවලියේදී රන්පදක්කමක් අනුෂාට හිමිවූ අතර එහිදී ලෝකඩ පදක්කමක් නිල්මිණීට ලැබුණි. ඥාති සොහොයුරියන් දෙදෙනෙකු වූ ඔවුන් පාසැල් වියේදී බොක්සිං ක්‍රීඩාවට යොමුව සිටියේ නැත. ඔවුන් ඒ සඳහා යොමුවූයේ ස්ලිම්ලයින් ක්‍රීඩා සමාජයට රැකියාව සඳහා පැමිණි පසුවය. එම ආයතන ප්‍රධානී ඩයන් ගෝමස් මහතාට එම ගෞරවය හිමිවිය යුතු බව දෙදෙනාම පවසති.

ඇලබඩගම සිංහල මහ විදුහලේ අධ්‍යාපනය ලබමින් පාසැලේදී වොලිබෝල් සහ කරාටේ ක්‍රීඩාවට පමණක් යොමුවූ මෙම යුවතියන් මතු යම් දිනක බොක්සිං ක්‍රීඩාව සඳහා ලෝක මට්ටමේ රන්පදක්කම් දිනාවියයි සිහිනෙන්වත් සිතන්නට නැත. විශේෂයෙන් ස්ලිම්ලයින් ක්‍රීඩා ආයතනයේ අනුග්‍රහය සහ කියුබානු පුහුණුකරුවෙකු යටතේ පුහුණු වන්නට ලැබීමත් නොසැලෙන අධිෂ්ඨානයකින් මහන්සි වී වැඩකිරීමත් මෙම ජයග්‍රහණයට හේතුවූ බව මෙම ක්‍රීඩිකාවෝ පෙන්වා දෙති.

අනුෂා සහ නිල්මිනී රුසියාවේ සිට පදක්කම් ගෙනෙන විට ඔවුන් දෙදෙන පිළිගන්නට සිය පවුල්වල අයත් බොක්සිං සංගමයේ නිලධාරීන් කීප දෙනෙක් හැරුණු විට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කිසිවෙකු කටුනායක ගුවන් තොටුපලට පැමිණ සිටියේ නැත. ක්‍රිකට් ක්‍රීඩාවට මලල ක්‍රීඩාවට මැති ඇමති වරුන් ඇතුළු ජනකායන් සහභාගි වෙමින් රතුපලස් එලා කරනු ලබන ක්‍රීඩකයින් පිළිගැන්ම ඒ ආකාරයෙන්ම නොවුවත් කිසියම් ගෞරවනීය මට්ටමකින් එම බොක්සිං පදක්කම් ලාභීන්ට නොවීම සැබැවින්ම කණගාටුවට කරුණකි.

♦ ධම්මික රත්නවීර

## කවි කොළය

# දැඩි සත්කාර ඒකකය හෙවත් Intensive Care Unit (ICU) හි මහා අබිරහස විසඳේ!

රෝහල්වල දැඩි සත්කාර ඒකක වාට්ටුව ඉතා අසාධ්‍ය රෝගීන් තබා ගන්නා අංශයයි. එහි ඇති ජීවිත ආධාරක යන්ත්‍රය හෙවත් ඉංග්‍රීසියෙන් හඳුන්වන **Life Support Machine** හුස්ම ගන්නට අපහසු, එමෙන්ම හෘද ක්‍රියාකාරීත්වය අඩපණ වූ රෝගීන්ට සම්බන්ධ කර එමගින් රෝගියාගේ පණ රැකගන්නට වෛද්‍යවරු උත්සාහ කරති. බොහෝ විට එම යන්ත්‍රයට සම්බන්ධ කිරීම ම රෝගියාගේ ජීවිතයේ අවදානම් තත්වය දක්වන්නකි.

එක් රටක රෝහලක එවැනි දැඩි සත්කාර ඒකක වාට්ටුවේ සිටි ලෙඩුන් එකි නෙකා දිනපතාම හරියට දහවල් දොළහට මිය යන්නට පටන්ගත්තේය. මුලින් අබිරහසක් වූ එයට හේතුව සොයාගත් අන්දම මෙම කවි පෙළෙන් දැක්වෙයි. මෙය ලංකාවේ රෝහලක වූ දෙයක්දැයි හරියටම කියන්නට බැරිය. වෙන්නටත් පුළුවන.

දැඩි සත්කාර ඒකකයෙහි සිටිය ලෙඩා
සිටියේ පැයකි දහවල් එකොළහට වඩා
මියගිය පුවත ඔහු නෑදෑ පිරිස හඬා
කීවෝ එහෙත් කුකුසක් පැන නැගිණි කුඩා

තව රෝගියෙකු අයි සී යූ එකෙහි රැකී
මියගිය නිසා පසුදා මොහොතෙහිම එකී
එය ගැටළුවක් විය පිළිතුරු නොදිය හැකී
දොස්තරවරුන්ටද මෙය මහ පුදුම යකී

පසුදා තෙවැනි බිල්ලද එම වෙලා වට
ඩැහැගත් නමුත් මරුවා මග බලා සිට
එය අසුවුණේ නැහැ දොස්තර නලා වට
මෙපුවත නිසා තිබුණා කැළඹිලා රට

ඉක්බිති සතර වැනි, පස්වැනි, සවැනි දිනේ
සිදුවිය මෙයම සත්වැනි දවසෙහිද අනේ
නැත කෙළවරක් මෙය දිගටම ඇදෙනු පෙනේ
නිදිගත් ඇමති උතුමා නැත අවදි වුණේ

හෙදියෝ මේක සලකා දොසකැයි බූත
කැඳවූ යකැදුරන් මාතර සිට ඈත
යතිවරු පැමිණ පන්සල් වල ළඟ පාත
ගැයුවෝ සෙත් පිරිත් හා බුදුගුණ ගීත

කළු සුදු රැවුල් ඇති බැඳගත් අය කොණ්ඩ
මහැදුරුවරුන් දැඟලන තැන අර ගන්ඩ
සමගින් කොවුර්ගේ ගෝලයො වැඩ දෙන්ඩ
ආවත් නොහැකි විය ගැටළුව විසඳන්ඩ

හෙළිකර ගැනීමට මෙහි සැඟවුණ ඇත්ත
යෙදුවා උපායක් දොස්තර තොට වත්ත
එළියට යවා හෙද හෙදි සේවක රොත්ත
ඔහු තනි වුණා දොර ඇතුළෙන් වහ ගත්ත

ඔර්ලෝසුවේ කටු එක පිට එකට සිට
හරියට දොළහ මහ දාවල් වදින විට
දොස්තර සිටී සැඟවී ලෙඩ ඇඳක යට
සේවකයෙක්ය ආවේ දොර විවර කොට

පොලිෂර් එකකි ඔහු අත
ඔප දමන බිම
සපයන බලය අයි සී යූ
එකට එම
ගලවා විදුලි ජේනුව
පොලිෂරයෙ තම
එහි සවි කළා,
සිදුවූ දේ කියනු කිම!



♦ තලංගම ජයසිංහ
Sri Lanka

## Nilmini Wins Gold For Boxing

Nilmini Jayasinghe, from a rural village, who became the Sri Lanka's first female boxer to clinch a world title, says she is delighted with the gold medal she won in Russia 3 weeks ago, defeating her Canadian counterpart Mandy Dujold at the finals. Another contestant, Anusha Koditu-wakku, a relative of Nilmini, won a bronze at the same tournament. Both girls who work for Slimline garment factories in Pannala had training under coach Mr Dayan Gomez.




**ඉරිදා SUN** -ප්‍රභාකරන්ගෙ තැන ගත්තු කේ පී කොටි සංවිධානෙ ලොක්කවෙලා මාසයක් ගියේ නෑ අන්න මැලේසියාවෙදි එහේ පොලීසයෙන් අල්ලලා දැන් ලංකාවට බාර දීලා. පිටරට ඉන්න ඩයස්පෝරාවට නොසෑහෙන්න හිතට අමාරුයි මොකද ගහනගහන තුරුම්පුව වරදිනවට. කේපී සති දෙකකකට ඉස්සෙල්ලා මූණ වහගෙන බීබීසී චැනල් 4 නිවුස්වල පෙනී හිටියා. එදා කිව්වා ප්‍රභා මැරෙන්න විනාඩි දහයකට කලින් කළපුව අයිනෙ ඉඳන් ටෙලිපෝන් කරලා කිව්වලු මට මොනවහරි උනොත් මචං උඹ ඊළම පිහිටවපන් කියලා. ඉතින් දැන් ඒකය කරන්න යන්නෙ කිව්වා. ජෝන් ස්නෝ ඇහුවා ඇත්තටම පුළුවන්ද පිහිටුවන්න කියලා. කේ පී කිව්වා, මොකද බැරි ? මේ කේපී යමක් කිව්වොත් කරලා තමයි පස්ස බලන්නෙ කිව්වා. දෙමළ මිනිස්සු බනිනවා මූ ගොන් රජෙක්. නිවුස් වලට ඔළුව දැම්ම නිසයි මූ අහුවුණේ කියලා. පොලීසිය හරියටම ඉන්න තැන හොයාගත්තා කියලා.

**සඳුදා MON** - පෙරෙයිදා කතා කළාම ආතර් මාම මෙහෙම කතාවක් කිව්වා. යුද්දෙ ඉවරවුණ නිසා දැන් බෝම්බ පුපුරන්නෙ නැහැ. කරදරයක් නැතුව ගමන් බිමන් යන්න පුළුවන්. හැබැයි තවම මැති ඇමතිවරු යුද්ධ කාලෙ වගේ ආරක්‍ෂක වාහන හතක් අටක් පිරිවරාගෙන පෙරහැරෙන් පිඹලා යනවා. කොහේ යනවද? මොකට යනවද කියලා තේරෙන්නෙ නැහැ. අපොයි මේ කන්නෙ රටේ සල්ලි නේද? මහජනයා ඒ වාහන වලින් බේරෙන්න පේමන්ට් එකට පනිනවා. යුද්දෙ ඉවරවුනාට ඇමතිවරු රට කාබාසිනියා කරන යුද්දෙ නම් ඉවර වෙන පාටක් නෑ.

**කුජදා TUE** -දැන් උග්‍ර ආණ්ඩු විරෝධියෙක් වෙලා ඉන්න ටික දවසකට විදේශ ඇමතිවෙලා හිටි මංගල මේ ළඟදි කියලා තිබුණා යුද්ධෙ දිනලා ආරක්‍ෂක හමුදා ජාතික කොඩිය උස්සලා වනපු එක වැරදිය කියලා. ලංකාවෙ හමුදා වෙන රටකට ගිහිල්ලා ඒ රට අල්ලලා යටත් කර ගෙන ශ්‍රීලංකා කොඩිය ඉස්සුව නම්ලු හරි. කොටි විරුද්ධකාරයො වුනාට උන් ලංකාවෙම ජනතාව හන්ද උන්ව පරද්දලා රජය සිංහ කොඩි වනපු එක වැරදිය කියලයි සමරවීර තුමා කියන්නෙ. කොටි ලංකාවෙ වුනාට උන් ලංකාවයි මහජනයයි මරලා විනාසකරපු හතුරො රැළක්. අනික උන් වැනුවෙ කොටි මූණ ගහපු ඊළම් කොඩිය. උන් ඒක වනද්දි ලංකා රජය සිංහ කොඩිය ඇර වෙන මොකක් වනන්නද? මෙහෙමත් ගොන්වහන්සෙ කෙනෙක්!

**බුදදා- WED** පින්නවල අලි අනාථාගාරෙ හිටපු කිරි බොන වයසෙ ඇත් පැටව් දෙන්නෙක් දළදා මාළිගාවෙ දියවඩන නිළමෙ ආයුධ පිරිවරාගත් ආරක්‍ෂක බළඇනියක් එක්ක ඇවිත් බලෙන් පැහැරගෙන ගිය කතාවක් ගැන අහලා මුළු ලංකාවම කම්පා වුණා. ලෝකෙ කිසිම රටක කරන්නෙ නැති අපරාධයක් ඒක. ඒ මිදිවට ඒ ඇත් පැටව් දෙන්නට පොලු වලින් ගැහුවලු හික්මවන්න කියලා. මිනිස්සු සාප කරනවා. අහනවා මෙහෙමත් නරුම යොද දන්ත ධාතූන් වහන්සෙ බාරව ඉන්නෙ? කියලා.

**ගුරුදා - THU** ළඟදි සොයාගෙන තියනවා සිංහරාජ වනාන්තරේ අක්කර සිය ගණනක් ඇමරිකාන් සමාගමකට බදුදෙන්න ලෑස්තිකරලා තියනබව. ලෝකෙ තියන ඉතාම දුර්ලභ ගස් හා බෙහෙත් පැළෑටි තියෙන්නෙ සිංහරාජ අඩවියෙ. මීට කලිනුත් ඇමරිකාවට සිංහරාජෙට රිංගන්න ඉඩදීලා අපේ තිබුණු කොතලහිඹටු වගේ බෙහෙත් පැළෑටි වල අයිතියත් දැන් ඇමරිකාව සතුකරගෙන. දැනටම ඒ වනාන්තරේ තියන වටින ගස් ටික එක එකා කපාගෙන යනවා. ඒවා හොයලා බලන්න කෙනෙක් නැහැ. පරිසරය ආරක්‍ෂාකරනවා කියන්නෙ බොරුවට. සල්ලි හම්බවෙනව නම් අපේ දේස පාළුවො සිංහරාජ අඩවිය නොවෙයි මුළු ලංකාවම පාළු කරන්න ලෑස්තියි.

**කිවිදා- FRI** දැන් ලංකාවෙ නක්ශාස්ත්‍රකාරයො තව සෙල්ලමක් පටන් අරගෙන. ඒ තමයි රාජ යෝග තියෙනවද නැද්ද කියලා කියන එක. ආණ්ඩුවේ මැති ඇමතිවරු උසස් පහත් හැම මට්ටමකම නිළධාරිවරු දැන් නිකං පිස්සු වෙන් වගේ සාස්තර කාරයන් පස්සෙ යනවා. මන්ත්‍රී කෙනෙකුට කිව්වොත් ඔබතුමාට රාජයෝගයක් තියනවා කියලා එදා ඉඳලා ඒ මන්ත්‍රී පුල් ට්‍රයි දාන්නෙ ඇමති කෙනෙක් වෙන්න. නිකං සාමාන්‍ය ක්ලාර්ක් කෙනෙකුට රාජයෝගයක් ගැන කිව්වොත් මැන් බලන්නෙ ඒ සමාගමේ ඩිරෙක්ටර් වෙන්න. පොලීසියෙ හමුදාවෙ කස්ටියටත් ඒ ලෙඩේ බෝවෙලයි කියලා කැතරින් කුඩම්මා කියනවා.

**ශනිදා- SAT** මහ භයානක විදියට දැන් ලංකාවෙ ඩෙංගු උණ පැතිරිලා යනවා. ඩෙංගු මරණ සංඛ්‍යාවත් සෑහෙන්න වැඩිවෙලා. කියුබාවෙන් බෙහෙත් වගයක් ගේන්න ලෑස්ති වුනාට ඒක කරලත් නැහැ. සල්ලි නැතිලු. හැබැයි මැති ඇමතිවරුන්ට සැප කාර් තවම අඩුවක් නැතුව ගෙන්නනවා. සෞඛ්‍ය ඇමති මේ අතරේ ඩෙංගු වැඩේ පැත්තකට දාලා බදුල්ලට වෙලා එයා ඊළඟ එන ඡන්දෙන් දිනන්නෙ කොහොමද කියලා ඒවැඩ කරනවා. තවම කොළඹ හැම තැනම කුණු ගොඩ ගහනවා. මදුරුවො බෝවෙනවා. මිනිස්සුන්ට අවශ්‍යත් නෑ මදුරුවො වඳකරන්න. මදුරු කොයිල් එකක් පත්තු කෙරුවම ඔක්කොම හරියාවිය කියලයි ඔක්කොම හිතන්නෙ. සංචාරක ව්‍යාපාරෙ නගගන්න කතාකරනවා. ඩෙංගු අස්සෙ සංචාරකයො යාවි ද?